# 7. දෙවි පියා සතුටු කරමු

සමන්මලී : අම්මේ............අම්මේ අනේ පව් ! මේ බලන්නකෝ කාණුවේ ලස්සන පූස් පැටියෙක් ! කවුදෝ දාලා ගිහිල්ලා.

අම්මා : පූස් පැටියෙක්....... කෝ බලන්න. අනේ ! අහිංසක සතා. හාමත්වෙලා වාගෙයි.



නිමල් : ඔව්, අම්මේ කිරි ටිකක් හදලා දෙන්නකෝ ඌට පොවන්න.

අම්මා : දුවේ පුතේ, සතාට වුණත් බඩගින්න උහුලන්න අමාරුයි. ඉන්න අපි කිරි ටිකක් හදමු.

සුමන්මලී : අපි යමු පූස් පැටියෝ..... ඔයාට කිරි පොවලා හොඳට බලා ගන්නම්.


අම්මා : ළමයිනේ මෙන්න කිරි ටික. පූස් පැටියාට පොවන්න. එත් ඔයාලා පූස් පැටියා වැඩිපුර අතගාන්න, ඉඹින්න යන්න එපා. ඇගේ කිනිතුල්ලෝ ඉන්න පාටයි. උගේ මයිල් නහයට ගියොත් ලෙඩ හැදෙනවා.

දරුවෝ : නෑ අම්මේ, අපි එයාව හොඳින් බලා ගන්නම්
(ටික වෙලාවකට පසුව)

අම්මා : දරුවනේ ගිහින් අර මල් පැළවලට වතුර දමන්න. අර බලන්න ඒවා ඔක්කෝ ම අව්වට මැළවිලා ගිහින්.

නිමල් : අනේ ඔව්මයි.

අම්මා : ඔයාලාට මතක ද ගිය
සෙනසුරාදා හවස
අපි පල්ලි
යන කොට
පියතුමා
එතුමාගේ
මල්වත්තේ
පැළවලට
වතුර
දානවා.





4. ශ්‍රේණිය - 130275

නිමල් : ඔව් අම්මේ,
ඒ විතරක් නොවෙයි.
එතුමා අපිට ආගම පාඩමේ දී කියා දුන්නා අසීසියේ ශුද්ධ වූ ප්‍රැන්සිස්තුමා ගස්වැල්වලට ආදරයෙන් කතා කළ බව.



අම්මා : ඔව් දරුවනේ, ගස්වැල් සහ සතුන් දෙවි පියා අපට දී තිබෙන වටිනා තෑගි. අපි සතුන්ට ආදරයෙන් සලකන්න ඕනෑ. කරුණාවන්ත වෙන්න ඕනෑ. ගස්වැල් මල් පලතුරු රැක ගන්න ඕනෑ. ඒවායේ ලස්සන බලලා සතුටු වෙන්නත් ඕනෑ.

## පැවරුම්

වාක්‍යවල හිස්තැනට සුදුසු වචන පාඩමෙන් සොයන්න. එම වචන හිස්තැන්වලට යොදා **අභ්‍යාස පොතෙහි ලියන්න.**

1. 1. සතුන්ට ..........................................සලකන්නට ඕනෑ.
   2. ගස්වැල් මල් පලතුරු ......................... ගන්න ඕනෑ.
   3. ඒවායේ ලස්සන බලලා ...................... වන්නට ඕනෑ.
2. ගස්වැල්වලට කතා කළ ශුද්ධවන්තයාගේ නම ලියන්න.
3. ඔබ කැමට ආශා කරන පලතුරු වර්ග 5 ක නම් ලියන්න. ඒවායේ පින්තූරද අභ්‍යාස පොතේ අඳින්න. අඳින ලද පින්තූරවලට යටින් රස පලතුරු දුන් දෙවි පියාට තුති වේවා යන වැකිය ලියන්න.